# ජගත් කලා ප්‍රවේශය

එච්. ටී. බස්නායක
උදා හෙට්ටිගේ



ජගත් කලා ප්‍රවේශය

© මහාචාර්ය එච්. ටී. බස්නායක
ජ්‍යෙෂ්ඨ කථිකාචාරිණී උදා හෙට්ටිගේ

ප්‍රථම මුද්‍රණය: 2007

ISBN - 955-20-8627-2

පරිගණක අක්ෂර සංයෝජනය: චින්තක ටයිප් සෙටින්
☎ 034-2223766

මුද්‍රණය: චතුර මුද්‍රණාලය
නො. 142, අවිස්සාවේල්ල පාර,
වැල්ලම්පිටිය.

ප්‍රකාශනය: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ
675, පී. ද එස්. කුලරත්න මාවත
කොළඹ 10

# හැඳින්වීම

ජගත් කලා ප්‍රවේශය නමින් කෘතියක් සම්පාදනය කිරීමට අප පෙළඹවූයේ කලාව පිළිබඳ ඇඩි උනන්දුවක් දක්වන්නන් ගේත්, සරසවි සිසුන් ගේත් පර්යේෂකයන්ගේත් අවශ්‍යතාවය පිරිමසා ලීමටයි. ලෝක කලාව පිළිබඳ සරල සිංහල බසින් සිංහල පාඨකයන්ට උසස් දැනුම ලබාගත හැකි කෘතියක් මෙතෙක් රචනා වී නොමැත. එබැවින්, ඔවුන්ගේ දැනුම වර්ධනය කර ගැනීම සඳහා මෙම කෘතිය සම්පාදනය කිරීමට අප තීරණය කළෙමු. මෙම කෘතිය සකස් කිරීමේදී අපේ මූලික අරමුණ වූයේ කලාව පිළිබඳ විචාරාත්මක කෘතියකට වඩා විස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කිරීමටයි. මෙහිදී අපේ අභිප්‍රාය වන්නේ, කලා කෘතිවලට අර්ථ කථනයන් දීමට හෝ කලාත්මක අගයන් විමසීමට හෝ නොව දැනට හමුවී තිබෙන කලාකෘති පිළිබඳව සවිස්තරාත්මක දැනුමක්, කලා රසිකයන්ට ලබාදීමයි. එසේම මෙහිදී විවිධ කලාකෘති පිළිබඳ ගම්‍ය කරගත හැකි තොරතුරු වලට වඩා ඒවායේ කලා වින්දන ස්වරූපය එළි දැක්වීමට උත්සාහ දරා තිබේ. පැරණි ශිෂ්ටාචාර වල මෙන්ම විවිධ රටවල නිර්මාණය වූ කලා කෘති බොහොමයක් කෞතුකාගාර වල සහ කලාගාර. වල තැන්පත්කොට ආරක්ෂා කිරීමට පශ්චාත් කාලීන ජනතාව ඇඩි උනන්දුවක් දරා ඇත.

අතීතයේදී නිර්මාණය වූ කලාකෘති බොහොමයක් ආගම ප්‍රචාර කිරීමේ මෙහෙවරක් වශයෙන් හෝ එසේත් නැත්නම් මායාකාරී බලවේග වලින් ප්‍රතිලාභ ලබාගන්නා අදහසින් හෝ සමාජයේ ලෞකික වශයෙන් ආදර්ශයක් එළිදැක්වීමට ක්‍රියාත්මක වූ ප්‍රයත්නයක් ලෙස හෝ පුද්ගලික අභිප්‍රායක් ඉෂ්ට කර ගැනීමට හෝ නිර්මාණය වී ඇති බව පෙනී යයි. මේ කෘතිය සකස් කිරීමේදී මානව හැඟීම් චේතනාවන් හා අභිප්‍රායන්ට අතීතයේදී ජනතාව විසින් දක්වන ලද ප්‍රතිචාර පෙන්වීමට, දෘශ්‍ය මාධ්‍යය විවිධාකාරයෙන් යොදාගත් අයුරු අනාවරණය කර ගැනීමට උත්සාහයක් දරා තිබේ. එබැවින් කලාකෘති නිපදවීමේදී පැරණි මිනිසාගේ මානව හැඟීම් මෙන්ම ඔහු විසින් ජීවනෝපාය සඳහා යොදාගන්නා ලද බුද්ධි

මෙහෙවරය ද එසේම ජීවිතය පිළිබඳ ඔහු තුළ පැවති විශ්වාසයන් හා උපදේශයන් පිළිබඳව ද අවධානය යොමු වේ. එසේම සමාජ වාතාවරණයට බලපෑම ඇතිකරන උත්තරීතර බලවේග හා අතීත මිනිසා තුළ පැවති බලාපොරොත්තු මෙන්ම භීතියන් ද මේ කලාකෘති වලින් හෙළි දරව් වේ. මේ හැර විවිධ යුග හා දේශයන් පිළිබඳවත්, විවිධ කාලවකවානු හා මානව වර්ගයා අතර බිහිවූ කලාකෘති පිළිබඳවත් අපගේ අවධානය යොමු කිරීමට අමතක නො කෙළෙමු. එබැවින් බොහෝ විට පරිච්ජේද පෙළ ගස්වා ඇත්තේ ලෝකයේ විවිධ ශිෂ්ටාචාර වල කාලනිර්ණයත් ඓතිහාසික වශයෙන් සිදුවූ වැදගත් සන්ධිස්ථානයනුත් සලකා ගෙනය. එසේහෙයින් මානව ශිෂ්ටාචාරයේ එඬේර යුගයේ සිට කෘෂිකාර්මික යුගයත් නාගරිකරණ යුගයත් අලලා බිහිවූ සමාජ ව්‍යුහයන් මෙන්ම රාජධානි බිහි වීම හා ව්‍යාප්තිය ද ලෝකයේ බිහි වූ විවිධ ආගම් ද යන සියළුම සංසිද්ධීන් කෙරෙහි අවධානය යොමුකොට මේ කෘතිය සම්පාදනය කොට තිබේ.

සෑම මානව සමාජයකම කලාව විශ්වාසයන් හා පුද පූජා පිළිබඳ සංකීර්ණ ව්‍යුහයක් ද සදාචාරාත්මක නීති පද්ධතියක් ද මායාකාරී බලවේග මෙන්ම ප්‍රබන්ධ කථා, මිත්‍යා කථා හා ඉතිහාසයෙන් එළි දැක්වෙන තොරතුරු ද කලාව මගින් ඉදිරිපත් කොට තිබේ. කලාව විද්‍යාත්මක දැනුමත්, මායාකාරී හෝ මිථ්‍යා සිතුවිලිත් අතර දෝලනය වේ. එසේම මිනිසාගේ දෘශ්‍ය පථයට හා විශ්වාසය අතර පවතින්නක් වශයෙන් දැක්විය හැකිය. කලාව මානව ශක්‍යතාවයත් මානව බලාපොරොත්තුත් අතර වැජඹෙන විෂය පථයකි. සන්නිවේදන මාර්ගයක් වශයෙන් භාෂා මාධ්‍යයට බෙහෙවින් සමීප වූ කලාව උපහාසාත්මක මෙන්ම ආචාරශීලී ගුණධර්ම ඉදිරිපත් කරන ස්වරූපයක් කලාව තුළ පවතී. එහෙත්, කලාව තුළ මායාකාරී බලවේගයකින් හෝ, වෙනත් විධික්‍රමයකින් හෝ භෞතික ලෝකය කෙරෙහි ඇඩිව බලපෑම් කළ හැකි ගුණාත්මක ලක්ෂණ ද අන්තර්ගත වී ඇත. කෙසේ වෙතත් ඕනෑම සමාජයක කලාව සඳහා තොරතුරු ලබන තේමාවන් සාමාන්‍ය ජනතාව අතර පවතින තොරතුරු වලින් අත්පත් කරගනු ලබන

සංසිද්ධීන් බව දැක්විය හැකිය. කලාව දෘෂ්‍යමාධ්‍යක් බවට පත්කිරීමේ දී එය විද්‍යමාන කළ හැක්කේ ඊට අදාළ උපකරණ මෙන්ම අවශ්‍ය ද්‍රව්‍යමය සාධක හා පහසුකම් ලබාගත හැකි ප්‍රමාණයට අනුකූලවය. එසේ ම පරපුරෙන් පරපුරට ප්‍රවීණත්වය පවත්වාගෙන යාමත් මෙහිදී කලාකෘති සම්පාදනයේදි බෙහෙවින් වැදගත් අංගයක් වනු ඇත. එහෙත් ඇතැම් විට කලාව පරිහානියට පත්වී නැවතත් සමාජීය හා සංස්කෘතිකමය ප්‍රවාහනයන් උද්දීපනය වීමේදී යළි අභිවෘද්ධිය කරා ගමන් කරයි. ස්ථාවර සමාජවල හෝ බොහෝවිට ස්ථාවරත්වයට පත් වෙමින්. පවතින සමාජවල කලාත්මක වෙනස්කම් ඇතිවන්නේ, බෙහෙවින් මන්දගාමීවය. නමුත් සක්‍රිය ගතිකත්වයෙන්, ආඪ්‍යවූ ඇතැම් සමාජයන්හි කලාත්මක වෙනස්කම් සීඝ්‍රයෙන් වර්ධනය වීමට පටන් ගනී.

ලෝකය පුරාම ඇඳීමෙන් හෝ චිත්‍රගත කිරීමෙන් දර්ශන සංරචනයක් සකස් කිරීම චිත්‍ර මගින් එළිදක්වනු ලබන කලා නිර්මාණයන් හි ක්‍රමවේදය වූ බව පෙනේ. බොහෝවිට මේ දර්ශනයන් හි ස්වභාව ධර්මයා තුළ පවතින පරිදි වර්ණාලේපය යොදා ගැනීමට කලා ශිල්පීන් පෙළඹී ඇත. ඉතාමත්ම පැරණි යුගයේ යැයි සැලකිය හැකි චිත්‍ර ප්‍රංශයේ හා ස්පාඤ්ඤයේ ලෙන් වලින් හමු වී තිබේ. ඒවායේ නිරූපණය වී ඇත්තේ පොළොවට හෝ අහසට අසම්බන්ධ රේඛාවලින් පමණක් දක්වන ලද සත්ව රූපය. ඒවා බොහෝවිට සම්බන්ධ වී තිබෙන්නේ දෘශ්‍යමය බවින් නොව මානසිකත්වය තුළිනි. පැරණි මිසරයේ රූපාක්ෂර ද චීනයේ සෙල්ලිපි ද කලාකෘති වශයෙන් දැක්විය හැකිය. මේවායේ විවිධ අංග නිරූපණය කිරීම සඳහා වර්ණාලේපය විවිධාකාරයෙන් භාවිතාකොට තිබේ.

ක්‍රි.ව. 16 වන සියවසේ පමණ පටන් යුරෝපයේ ආකෘතික හැඩයන් රේඛාවන්ගෙන් ලකුණු නොකොට වර්ණා ලේපය භාවිතා කොට තිබෙනු බව පෙනේ. බටහිර ලෝකයේ චිත්‍ර ඇඳීමේ ආරම්භය බිහිවූයේ, දර්ශනයක් ජනෙල් කවුළුවකින් දර්ශනය වන භෞතික හෝ මනඃකල්පිත ලෝකයේ චිත්ත දර්ශනයක් ලබා

ගන්නා සංකල්පයට අනුකූලවය. එය සංවර්ධනය වූයේ ජ්‍යාමිතික දර්ශනයක විලාසයකින් බව පෙනේ. වර්ණ යෝජන ක්‍රමයත්, අඳුර හා එළිය දැක්වෙන ආකාරයත් එසේම වර්ණ ප්‍රමාණ යෙදීමේ ක්‍රමය හා නියමිත වර්ණ හා පරාවර්තිත වර්ණත් දැක්වීම මේ තාක්ෂණයේ මූලධර්මවල අනුකූලවන ආකාරයට බව පෙනේ. චිත්‍ර ශිල්පියා විසින් මෙබඳු උපාය මාර්ගයන් නරඹන්නාගේ නෙත් රැවටීමට යොදාගත්ත ද මායාකාරීවත්වය ඉන් උද්දීපනය වන බව නොදැක්වේ. මෙම ක්‍රමය තුළින් බටහිර කලා ආකෘතිය නිර්මාණය වී තිබේ. මෙබඳු කලාකෘති නිර්මාණය කිරීමේ තාක්ෂණයක් ක්‍රි. ව. 16 වන සියවසේ සිට මූලික අරමුණ වී තිබුණ ද පුනරුදයත් සමඟ සුන්දරත්වය පිළිබඳ අදහස බටහිර කලාකරුවාගේ සිද්ධාන්තය බවට පත්විය. මින් පසු ඔවුන් දෘශ්‍ය මාන භාවයේ යථාර්ථය පෙන්වීමට සමීප වන්නට පටන්ගත් බව පෙනේ. ක්‍රි. ව. 19 වන සියවස වන විට ඔවුන් ඒ පිළිබඳ දැඩි අවධානයක් යොදන්නට විය. මේ අතර තුර දර්ශන පථයට අනුකූලව චිත්‍ර ඇඳීමේ ක්‍රමය නිසා කලා ශිල්පියාත්, කලා කෘතියත් ජනතාවත් අතර දැඩි සම්බන්ධතාවයක් ගොඩ නැගිණ.

කලාකෘති ආගමික සාමාජීය හෝ දේශපාලන අරමුණක් ප්‍රකාශනය කිරීමට නිර්මාණය කළේ නම් එබඳු කලාකෘති නිර්මාණය වී ඇත්තේ සෞන්දර්යාත්මක ගුණාංග කෙරෙහි අවම අවධානය යොමු කිරීමෙනි. එබඳු කලාකෘති නිශ්පාදනය වූයේ මිනිසා තුළ පවතින මූලික පෙළඹවීම් දෙකක් හේතුකොට ගෙනය. එනම් ස්වභාව ධර්මයා හා ස්වභාවධර්මයාගේ ආකෘතික හැඩයන් තුළ අනුපිළිවෙළක් ඇතිකිරීමටත්, එකිනෙකා අතර හෝ දෙපිරිසක් අතර පවත්නා වෙනස්කම් අභිබවා ගොස් පුද්ගලිකත්වය ඉස්මතු කිරීම සඳහාය. විවිධ වස්තු නිර්මාණය කිරීමේදී ආකෘතික හැඩයන් සහ වර්ණයන් භාවිත කිරීම සාමාන්‍ය සිරිතකි. සෑම සංස්කෘතියකම එබඳු ආකල්ප විද්‍යමාන වේ. එහෙත් ඇතැම් විට හැඩයෙහි හෝ කාර්යයන්හි එසේ නොමැතිනම් ඒ සඳහා යොදාගනු ලබන ද්‍රව්‍ය සාධකයන් හි වෙනස්කම් පැවතිය හැකිය. ඇතැම්විට යමෙකුගේ තරාතිරම පෙන්වීමට වර්ණය භාවිතා කළ හැකිය. නමුත් බොහෝ

විට ආරක්ෂා කිරීමේ මායාකාරී බලවේගයක් එහි දක්නට ලැබේ. නිදසුනක් ලෙස ක්‍රි. ව. 6 වන සියවසේ දී රවෙන්නා (Ravenna) නම් ස්ථානයෙන් අනාවරණය කරගත් චිත්‍රාවලියක ක්‍රිස්තියානි සංකේත දක්වා තිබීම පෙන්වා දිය හැකිය. කලාකෘති නිර්මාණය වූ කල අවධීන්ට සම්බන්ධ නොකොට ඒවා අර්ථ කථනය කිරීම අපහසුය. කලා කෘතියක් නිර්මිත පසුබිම නොදැන කලාකෘතියක අර්ථ කථනය බෙහෙවින්ම දුෂ්කරය. ප්‍රතිමා නිර්මාණ මූලධර්ම අධ්‍යයන ක්ෂේත්‍රයෙන් සිදුකරනු ලබන්නේ කලාකෘතියක, සාමාන්‍යයෙන් සංස්කෘතික වටපිටාවෙන් නිර්මිත වූ කලාකෘතියක මූලික වැදගත්කම හඳුනා දැක්වීමයි. බොහෝ කලාකෘතිවල මතුපිට හුවා දැක්වූ අර්ථ හැඟවීම දැක්වීමට පුළුවන. අර්ථ ගැන්වීම සාමාන්‍ය වශයෙන් සිදු කෙරෙන්නේ විවිධ පැති පිළිබඳ අවධානය යොමුකර වීමෙනි. ඇතැම් විට ඍජු අර්ථයක් හෝ සංකේතාත්මක අර්ථයක් හෝ උදාහරණ අර්ථයක් ගැබ්වී තිබෙන්නට පුළුවන. මෙබඳු අර්ථ හැඟවීම චිත්‍ර ඇඳීමේ උපාය මාර්ගවල නිරන්තරයෙන්ම දක්නට ලැබේ. නිදසුනක් වශයෙන් නො ගැළපෙන සමාජීය ගතිකත්වයන් හෝ භීෂණකාරී ආවේගයන් ජනිත කරවීමට මේ කලාකෘති සමත් වේ. එසේම චිත්‍ර ඇඳීමේදී යම් යම් පුරුෂයන්ගේ වැදගත්කම ද දැක්වීම සඳහා ප්‍රමාණ වෙනස් කිරීමටත්, ප්‍රධාන රූපය කේන්ද්‍රස්ථාන කොට ගෙනද ඇඳීමට පෙළඹී ඇත. නිදසුන් ලෙස බුදුන් වහන්සේ ගේ රුව දෙපසින් බෝධිසත්ව වරු කුඩා පරිමාණයෙන් නිරූපණය කිරීමට ද ක්‍රිස්තුස් වහන්සේගේ රුව දෙපසින් සාන්තු වරුන් දෙදෙනකුගේ කුඩා රූප ද දර්ශනය කිරීම හෝ විය හැකිවේ. කැටයම මධ්‍යයෙහි දක්වා ඇති ප්‍රධාන රුව සාමාන්‍යයෙන් නිරූපණය කරනු ලබන්නේ ඍජුව ඉදිරිපස බලා ඉන්නා ආකාරටය. දෙපසින් නිරූපිත රූප දක්වෙනුයේ පැතිපෙනුම දක්වන පරිද්දෙනි. සම්මිතික භාවය නොදැක් වූ විට නරඹන්නා ගේ නෙතට සංරචනයේ ප්‍රධාන අරමුණ ගම්‍යකිරීම දුෂ්කරය. මූර්ති ශිල්පියාගේ කාර්යය ද මේ අනුසාරයෙන් උන්නතාකාරයෙන් මූර්ති නෙළීමේ දී මේ උපාය මාර්ග යොදාගෙන ඇත. පැරණි මිසර කලාවේ, බිතුසිතුවම් හා මූර්ති කලා අතර පැවතියේ ඉතා සුළු වෙනසකි. මූර්ති නොගැඹුරු

උන්නත ස්වරූපයකින් දක්වා ඇත. විශේෂයෙන් වටිනා ලෝහ, ලෝකඩ හා තද පාෂාණ වර්ග වලින් මූර්ති සම්පාදනය කොට තිබේ. බොහෝවිට කල්පවත්නා ද්‍රව්‍ය භාවිතකොට ඇත්තේ අමරණීයත්වය ඊට අන්තර්ගත කිරීමටය. විශේෂයෙන් කිරිගරුඬවලින් තැනූ රාජකීය රූප හමුවී තිබේ. එපමණක් නොව ප්‍රමාණය අති විශාල අන්දමින් දක්වන්නේ නම් එය උත්තරීතර බලය විදහා දැක්වීමට ගත් ආයාසයකි. මේ අනුව ආකෘතික හැඩයන් සඳහා යම්කිසි ක්‍රමවේදයක් පැවති බවට සාධක තිබේ. එසේම ප්‍රමාණය හා ද්‍රව්‍යයය මූර්තිවන මෙන් වාස්තු විද්‍යාවේ උදාරත්වය පෙන්වීමට යොදාගෙන ඇත. යම් කිසි ගොඩනැගිල්ලක් අතිවිශාල අන්දමින් නිර්මාණය කළේ නම් එම විශාලත්වය තුළින් එහි වැදගත් භාවය විද්‍යමාන කරනු ලැබේ. නිවාසවල ප්‍රමාණයත් එහි දක්වා ඇති පිටත සැරසිලි වලින් ගම්‍යවන්නේ, සමාජ ස්ථරයේ පවත්නා ස්තරකරණයයි. බොහෝ සමාජවල සංස්කෘතීන් මගින් වාස්තු විද්‍යාත්මක නිර්මාණ මානව ක්‍රියාකාරකම්වලට අනුකූලව සිදු වී  තිබෙන බව දැක් විය හැකිය. සාමාන්‍යයෙන් ජනාවාසයක පෙළ ගැස්ම සිදුවී තිබෙන්නේ, ඔවුනොවුන් අතර බැඳී පැවති සබඳතාත් එසේම බාහිර බලවේගයන් සමඟ පවත්නා සබඳතාවලටත් අනුකූලවය. සෑම ජනාවාසයකම ඇති නිවාස ඔවුනොවුන්ගේ තරාතිරම් වලට අනුව නිර්මාණය වන්නට ඇතැයි නිගමනය කළ හැකිය.

කලාව, ශිල්පීය නිපුණත්වය හා තාක්ෂණය යන වචන තුන දහසය වන සියවසේ පටන් අපරදිග ලෝකයේ වෙනම අර්ථ ගෙනදෙන වචන තුනක් විය. යම්කිසි කලාභාණ්ඩයක් නිර්මාණය කිරීම රඳා පවත්නේ, මානුෂික ප්‍රවීණත්වය හා තාක්ෂණික ඥානය මතය. වළං භාණ්ඩයක් හෝ පූජ්‍යස්ථානයක් හෝ ප්‍රතිමාවක් නිර්මාණය කිරීමේදී ආකෘතික හැඩයේ සහ සැරසිලි ක්‍රමයේ දක්ෂතාවයක් පැවතිය යුතුය. ගොඩනැගිලි නිර්මාණයේදී මූලික ක්‍රම දෙකක් පවතී. එනම් කණු දෙකක් මත හරස් පරාලයක් ඇමීමෙන් හා විවෘත කවුළු දැක්වෙන පරිදි බිත්ති තැනීමෙනි. පැරණි මිසරයේ හා ග්‍රීසියේ තනන ලද පූජ්‍යස්ථාන කුළුනු මත හරස්පරාල ඇමීමෙන් නිර්මිත වාස්තු විද්‍යා ක්‍රමය ඉදිරිපත් කොට තිබේ. ඒවායේ බිත්ති

ප්‍රවීණත්වයක් හා ශිල්පීය ගුණයක් අවශ්‍ය නිසාත් ඔවුන්ට ශ්‍රමිකයන්ගේ හා ශිල්පීන් ගේ වැඩකටයුතු සංවිධානය කිරීමට සිදු වන නිසාත්ය. දෘෂ්‍ය කලා කෘති ශිල්පීන් විසින් නිර්මාණය කරනු ලබන අද්විතීය නිර්මාණයන් ලෙසත් ඔවුන් අනුගමණය කරන ශෛලීන් ඔවුන්ගේ පුද්ගලිකත්වය විදහාපාන නිර්මාණ ලෙසත් දැක්විය හැකිය. ඇතැම් අංග අතින් සලකා බලන විට කලාවේ ඉතිහාසය සාහිත්‍ය ඉතිහාසය සමඟ සංසන්දනය කළ හැකිය. මේ ක්ෂෙත්‍ර දෙකෙහිම අඛණ්ඩ පැවැත්මක් හා ශෛලීන් වෙනස්කම් ද දක්නට ලැබේ. එසේම මෙකී ක්ෂෙත්‍ර දෙකෙහිම ඉතා උසස් කෘති නිර්මාණය වේ. කෙසේ හෝ කලාකෘතිය රඳා පවත්නේ භෞතික ද්‍රව්‍යමය සාධක මතය. එහෙත්, කලා භාණ්ඩවල පැවැත්ම සාහිත්‍ය කෘතිවල පැවැත්මට වඩා දිර්ඝ කාලීන වේ. මිනිසාගේ බලාපොරොත්තු හා අභිප්‍රායන් ගම්‍ය කර ගැනීමට දෘශ්‍යකලාකෘති ඉවහල් කරගත හැකිය. උසස් කලාකෘති සෞන්දර්යාත්මක වශයෙන් ප්‍රසන්න වස්තු වූවා පමණක් නොව මානව ප්‍රවීණත්වයන් සහ ශක්‍යතාවයන් ප්‍රදර්ශනය කෙරෙන කාර්යයන් වේ. එබඳු කලා කෘති තුළින්, අපගේ ප්‍රඥාව වර්ධනය වනවා පමණක් නොව අපගේ දැනුමද තීව්‍ර වනු ඇත. එසේම වෙනත් විවිධ ක්ෂෙත්‍ර පිළිබඳ වූ අපගේ දැණුම ද පුළුල් වේ. කෙටියෙන් පවසතොත් කලාකෘති මගින් ස්වභාව ධර්මයාගේ තොරතුරු දැනගැනීමට පිටුවහලක් වනු ඇත. ඒ නිසා කලාවේ ඉතිහාසය යනු මානව වර්ගයාගේ ඉතිහාසයේ ඉතාමත් වැදගත් කොටසකි. අවසාන වශයෙන් මෙහිදී දැක්විය හැක්කේ ඉහත කී කරුණු පිළිබඳ අවධානය යොමුකරමින් මේ කෘතිය සම්පාදනය කළ බව ප්‍රකාශ කිරීමය.

මහාචාර්ය එච්. ටී. බස්නායක.
ජ්‍යෙෂ්ඨ කථිකාචාරිණි උදා හෙට්ටිගේ.
කැලණිය විශ්වවිද්‍යාලය,
කැලණිය